පොදු චක්‍ර ලේඛ ලිපි අංක - 01-17/2025

මගේ අංක : TCS/T 30/GMOA/2023
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.
26.04.2025

පලාත් ප්‍රධාන ලේකම්වරු, පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු, පලාත් සෞඛ්‍ය ලේකම්වරු
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජාතික රෝහල කොළඹ සහ මහනුවර,
ජාතික, ශික්ෂණ, පළාත්, හා දිස්ත්‍රික් මහා රෝහල් සහ විශේෂිත රෝහල් සහ මහජන සෞඛ්‍ය ආයතනවල
අධ්‍යක්ෂවරු, පළාත් හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,
මූලික රෝහල් වෛද්‍ය අධිකාරීන් සහ සියලුම ආයතන හාර වෛද්‍ය නිලධාරීන් වෙත,

<u>ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අත්හිටවූ වෛද්‍ය නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම.</u>

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය නිලධරයෙකුගේ ලියාපදිංචිය අත්හිටුවා ඇති අවස්ථාවකදී එම නිලධාරියා සේවයේ යෙදවීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

I. වෛද්‍ය ආඥා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධරයෙකුගේ ලියාපදිංචිය අත්හිටවූ විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් එම වෛද්‍ය නිලධරයාගේ සේවය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවිය යුතුය. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිලධරයාගේ වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අත්හිටුවීමට තීරණය ගත් දින සිට ඉදිරියට එය ක්‍රියාත්මක විය යුතුය.

II. වෛද්‍ය නිලධරයෙකුගේ සේවය ඉහත පරිදි අත්හිටුවා ඇති කාල සීමාව වැටුප් රහිත කාලයක් ලෙස සැලකිය යුතු අතර, එසේ බණ්ඩනය වූ සේවා කාලය ඔහුගේ/ ඇයගේ සක්‍රිය සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතුය. වෛද්‍ය නිලධාරියා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නැවත ලබාගෙන ඉදිරිපත් කළ පසු නිලධාරියා නැවත සේවයේ පිහිටවිය යුතුය.

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් වෛද්‍ය නිලධරයාගේ ලියාපදිංචිය අත් හිටුවීමට පාදක වූ කරුණු සම්බන්ධයෙන්ම විනය බලධරයෙකු විසින් එකී නිලධරයා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම හෝ එසේ විනයානුකූලව කටයුතු කිරීමේදී නිලධාරියාට එරෙහිව විනය බලධරයා විසින් ගනු ලබන නියෝගයක් හෝ තීරණයක් ක්‍රියාත්මක කිරීම ඉහත 01 හෝ 02 ඡේදයන්හි සඳහන් ක්‍රියාමාර්ග වලට ස්වාධීන වශයෙන් සිදුවිය යුතුය.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්

පිටපත් : ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව